අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# බදු පදනම යටතේ ගොඩනැගිලි ලබා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතියේ පහත සඳහන් කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා සුදුසු වාණිජමය ආරක්ෂිත පරිසරයකින් යුතු කාර්යාලයීය ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීම සඳහා කෙරෙන විවෘත ටෙන්ඩර්පත් කැඳවීමයි.

| අනු අංකය | දිස්ත්‍රික් කාර්යාලය | ගොඩනැගිල්ල පිහිටිය යුතු නගරය | අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | පුත්තලම කාර්යාලය | හලාවත | 2700 – 3000 |
| 2 | මහනුවර කාර්යාලය | මහනුවර | 3710 – 4000 |
| 3 | ත්‍රිකුණාමල කාර්යාලය | ත්‍රිකුණාමලය | 2500 – 3000 |

**ගොඩනැගිල්ල සම්බන්ධව සපුරාලිය යුතු සුදුසුකම්**

- ටෙන්ඩර් ඉදිරිපත් කරන ගොඩනැගිලි ඉහත සඳහන් නගරවල ප්‍රධාන මාර්ගයට හෝ අතුරු මාර්ගයකට මුහුණලා නගර ආසන්නයේ තිබිය යුතුය.
- ටෙන්ඩර් ඉදිරිපත් කරන ගොඩනැගිල්ල කාර්යාලයක් පවත්වාගෙන යාමට සුදුසු ආකාරයෙන් තිබිය යුතු අතර, පොළොව ටයිල් අතුරා තිබිය යුතුය.
- කාර්යාල පරිශ්‍ර ත්‍රිත්වය තුළම අවම වශයෙන් වාහන 03 ක් වත් නතර කර තැබීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- නියමිත ඉඩකඩ සහ ප්‍රමිතියකින් යුක්ත සනීපාරක්ෂක පහසුකම් ලබා දීමට අවම වශයෙන් වැසිකිළි 03 වත් තිබිය යුතුය.
- **සම්පූර්ණ ගොඩනැගිල්ලම වායු සමනය කර තිබිය යුතුය. එම වායු සමන යන්ත්‍ර සේවා කටයුතු, නඩත්තු සහ අලුත්වැඩියාවන් අයිතිකරු විසින් සිදු කර දිය යුතුය.**
- ජලය හා විදුලි සැපයුම් මීටර මනු කියවීම් සඳහා වෙන් වෙන් වශයෙන් තිබිය යුතු අතර, ජලය රැස්කර තබාගැනීම සඳහා අවම වශයෙන් ලීටර් 1000 කට වඩා ධාරිතාවයක් සහිත ජල ටැංකි තිබිය යුතුය.
- ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් සමග අදාළ අනුමත ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම, වරිපනම් අංකය, පදිංචිය සනාථ කිරීමේ සහතිකය හා ඔප්පුවේ පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ මාසික කුලිය මෙන් 6 ගුණයක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදෙනු ඇත.

අයිතිය සනාථ කරන සහ අදාළ අනෙකුත් සියලුම ලිපි ලේඛන සමග අයිතිකරුවන් හෝ අයිතිය ඇටෝර්නි බලපත්‍රයක් මගින් හිමිකර දී ඇති ඇටෝනිලාභීන් විසින් පමණක් අදාළ මිල ගණන් 2026.08.03 දිනට පෙර සමිතියේ ප්‍රධාන සභාපතිට ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතු අතර, ටෙන්ඩර්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ **"(නගරයේ නම) කාර්යාල ගොඩනැගිල්ල සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"** යනුවෙන් සටහන් කර තිබිය යුතුය.

**සැ යු :** ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා සකස් කරන ලද ආකෘති පත්‍රයක් ප්‍රධාන කාර්යාලය මගින්, අදාළ කාර්යාලයට පිවිසීමෙන් හෝ www.edcs.lk වෙබ් අඩවිය වෙතින් ලබාගත යුතු අතර, එම ආකෘති පත්‍රය මගින් පමණක් ටෙන්ඩර් එවිය යුතුය. ඔබ විසින් ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගනු ලබන්නේ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර එම තීරණය අවසාන තීරණය වන බව කාරුණිකව දන්වමි.


**ප්‍රධාන සභාපති,**

**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ**

**සමුපකාර සකසුරුම්කම සහ ණයදෙන සමිතිය,**

**අංක 294, ගාලු පාර, කොළඹ 03.**

**දුරකථන : 011-2266000 EX - 1019/1022**